**ශීර්ෂය 016 - පාර්ලිමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 016- පාර්ලිමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ට අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ පුනරාවර්තන වැය විෂයන් 06 කින් රු.74,000,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයන් 05 කට හා මූලධන වැය විෂයයක් වෙත මු.රෙ.66 මගින් මාරු කර තිබුණි. | 2022 වර්ෂයේ රට තුල පැවති උද්ධමනය නිසා වියදම් ඇස්තමේන්තු යටතේ ලබා ගැනීමට අපේක්ෂා කළ භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් වැඩි වුවද පාර්ලිමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දී දැරිය යුතු වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට උපරිම ප්‍රයත්න දැරිය යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (ඇමුණුම iii හි) බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණු සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් 08 ක එකතුව රු.9,486,836 ක බැරකම් 2023 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට විස්තර සොයා ගැනීමට නොහැකිවූ බැඳීම් හා බැරකම්වල අගයන් බැරකම් ප්‍රකාශයනයෙහි ඇතුළත් වී නොමැති අතර ඉදිරියේදී මෙම තත්ත්වය අවම වන අයුරින් කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | වර්ෂයට අදාල සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

## 2.3 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2013 දෙසැම්බර් 30 දිනැති අංක 234/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 ඡේදය | - | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වැටුප් සකස් කිරීම සඳහා හඳුන්වා දී ඇති GPS පරිගණක වැඩසටහන වෙනුවට වෙනත් පරිගණක වැඩසටහනක් භාවිතා කරන්නේ නම් ඒ සම්බන්ධ වාර්තාවක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් වැටුප් සකස් කිරීම සඳහා යොදාගෙන ඇති වැඩසටහන සඳහා ලබාගත් අනුමැතියක් ඉදිරිපත් නොවීය. | මෙම පද්ධතිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ නිලධාරීන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ගොස් අදාල තොරතුරු හා පැහැදිලි කිරීම් ඉදිරිපත් කර වාචිකව අනුමැතිය ලබා ගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1985 මැයි 10 දිනැති අංක 289 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු බව දක්වා ඇතත්, පාර්ලිමේන්තුවේ සියළුම වාහන සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි. | පසුගිය කාලයේ මතු වූ තත්ත්වය මත ලැබුණු ආරක්ෂක උපදෙස් අනුව වාහනවල යොදා තිබුණු “සෙංකෝලය” ලාංඡනය තාවකාලිකව ගලවා ඉවත් කිරීමට සිදු විය. ආරක්ෂක කමිටුවට ඉදිරිපත් කොට ලැබෙන උපදෙස් මත ඉදිරියේදී කටයුතු කිරීමට නියමිතය. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීමේ හැකියාව අධ්‍යයනය කර කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.743,759,062 ක් වූ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 13 හි 4 ඡේදය ප්‍රකාරව නියමිත ආකෘතියෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණු අතර එහි 4.2.1 ප්‍රකාරව පිළියෙල කළ යුතු සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | එකඟ වේ.<br><br>2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ආකෘතිය අනුව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ මූලධන ප්‍රසම්පාදන කාර්යයන් 34 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.551,192,552 ක් විය. සමාලෝචිත වර්ෂයේ මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.132,000,000 ක් වූ නමුත් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. එසේම වර්ෂයේ අවසාන දිනට ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි ඵලදායීතාවය විගණනයේදී ඇගැයීමට ලක්කළ නොහැකි විය. | එකඟ වේ.<br><br>චක්‍රලේඛ මඟින් ප්‍රාග්ධන වියදම් සීමා පැනවූ බැවින් අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදන පමණක් 2022 වර්ෂයේදී සිදු කරන ලදි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට නොහැකි විය.<br><br>2022 කාර්යසාධන වාර්තාව සැකසීමේදී ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය සකසා තිබූ නමුත් එය විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය සඳහාද කටුනායක නිල නිවස , මාදිවෙල නිල නිවාස 108, නුවරඑළියේ සෙන්පති මැදුර නිවාඩු නිකේතනය හා අනුරාධපුරයේ මෙත් සෙවන නිවාඩු නිකේතනයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ.<br>ප්‍රායෝගික හේතුමත යම් කාල පමාවක් ඇති වුවත් එය අවම කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු යාවත්කාලීනව සිදුකර වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පුස්තකාලවලට අත්පත් කර ගන්නා ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය, සම්බන්ධයෙන් පැවැත්විය යුතු වාර්ෂික සමීක්ෂණ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පුස්තකාලය සම්බන්ධයෙන් පවත්වා නොතිබුණි. | එකඟ වේ.<br>වාර්ෂිකව සමීක්ෂණය පැවැත්වීමට ප්‍රායෝගික අපහසුතා ඇති බැවින් පුස්තකාලාධිපති තනතුර සඳහා නව පත්වීමක් ලබන අවස්ථාවන්හිදී සමීක්ෂණක් පැවැත්වීම සිදු කරන අතර 2023 වසර සඳහා වාර්ෂික සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

### 3.3.1. නිල නිවාස කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1993 මැයි 28 දින පවත්වා තිබූ ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව අනුව මාදිවෙල නිවාස සංකීර්ණයේ නිල නිවාස සඳහා 1993 වර්ෂයේ සිට අය කරනු ලබන රු.1,000 ක නිවාස කුලී මුදල සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ.<br>නිවාස සංකීර්ණයේ සිදු කිරීමට යෝජිත අළුත්වැඩියාවන් සිදු කිරීමෙන් පසුව නිවාස කුලිය වැඩිකිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2023 අප්‍රේල් 04 දින පැවති ගෘහ කාරක සභාවේදී යෝජනා විය. | නිවාසවල වටිනාකම තක්සේරු කර කුලී මුදල සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මාදිවෙල නිවාස ලබා දීමේ දී පාර්ලිමේන්තු මහලේකම් සමග ඇති කර ගනු ලබන ගිවිසුම ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි වූ වහාම නිල නිවාස හිස්කර නැවත භාර දීම සිදු කළ යුතු අතර, එසේ නිල නිවාස භාර නොදුන් කාලය වෙනුවෙන් | 2023.03.22 දින මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තුමේන්තුව දැනුවත් කර ඇති අතර නඩු පැවරීමට එහි උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ගිවිසුම ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි වූ විගස නිල නිවාස හිස්කර නැවත භාර ගැනීමට සහ අදාල ගාස්තු කඩිනමින් අය |

| | | | |
|---|---|---|---|
| | මන්ත්‍රීවරු 06 දෙනෙකුගෙන් දිනකට රු.500 බැගින් දණ්ඩන මුදලක් සහ අයවිය යුතු විදුලි, ජල බිල්පත් ඇතුලුව රු.455,904 ක මුදලක් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 15 දින වනවිට අය කර ගැනීමට හැකිවී නොතිබුණි. | | කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. |
| (ඈ) | 2020 දෙසැම්බර් 19 දිනැති අංක 20/1997/302/028 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මාදිවෙල නිල නිවාස ලබා ගැනීමට නොහැකි වූ මන්ත්‍රීවරුන් සඳහා මාසිකව රු.75,000 ක් ගෙවනු ලබන අතර 2021 වර්ෂයේ මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට සහ 2022 සැප්තැම්බර් මාසය දක්වා මන්ත්‍රීවරුන් 08 දෙනෙකුට පිළිවෙලින් රු.6,750,000 ක් හා රු.4,875,000 ක් එසේ ගෙවා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. නිවාස හිමිකම ලබන සෑම මන්ත්‍රීවරයෙකුටම මාදිවෙල නිවාස සංකීර්ණයේ පවතින සීමාව තුල නිවසක් හැකි ඉක්මණින් ලබා දීමට කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දුනි. | පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි වූ විගස නිල නිවාසය හිස්කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තුළින් ගෙවනු ලබන නිවාස කුළිය අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | මාදිවෙල නිල නිවාසවල ජල, විදුලි හා දුරකථන බිල්පත් සඳහා තැන්පතු ලෙස අය කරනු ලබන රු.1,000 ක මුදල, කාලීනව සමාලෝචනය කර සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි | නිරීක්ෂණය නිවැරදි වේ. ඉදිරියේදී පැවැත්වෙන ගෘහ්‍ය කාරක සභාවට කරුණු ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | බිල්පත් සඳහා තැන්පතු ලෙස අය කරනු ලබන ගාස්තු කාලීනව සමාලෝචනය කර සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2020 නොවැම්බර් 25 දින පවත්වා තිබූ නවවැනි පාර්ලිමේන්තුවේ පළමු ගෘහ්‍ය කාරක සභා සැසිවාරයේදී සාකච්ඡා වී තිබූ පරිදි ඒ ඒ අමාත්‍යාංශවලින් රජයේ බංගලා නිවාස ලබා දී ඇති අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් මාදිවෙල නිවාස සංකීර්ණයෙන් ලබා ගෙන පවතින මන්ත්‍රී නිල නිවාස ආපසු භාර දීමෙන් හා පාර්ලිමේන්තු මහලේකම් විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමෙන් එම නිවාස හිස් කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2023 මැයි 16 දින වන විටත් අමාත්‍යවරුන් තිදෙනෙකු මාදිවෙල මන්ත්‍රී නිල නිවාසයන් ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. අදාල නිල නිවාස නැවත පාර්ලිමේන්තුව වෙත භාර දීමට කටයුතු කරන මෙන් දන්වමින් 2023 අප්‍රේල් මස 04 දිනැතිව ගරු කථානායකතුමාගේ අත්සනින් ලිපි යොමු කළ අතර ඉදිරි ගෘහ්‍ය කාරක සභාවේ දී ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කිරීමට අපේක්ෂා කරනු ලබයි. | ගෘහ්‍ය කාරක සභා සැසිවාරයේදී සාකච්ඡා වී තිබූ පරිදි නිල නිවාස ආපසු භාර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දී තිබූ නිල නිවාසයක් සඳහා අයවිය යුතු නිවාස කුලී රු. 27,857 ක මුදලක් ඔහුගේ මන්ත්‍රී දීමනාවෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ.<br><br>පාර්ලිමේන්තුවට පරිබාහිර ආයතනයක් මඟින් මෙම නිවස වෙන්කර දී ඇති අතර මෙම මුදල අයකර ගැනීමට ගරු මන්ත්‍රීතුමාගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ මුදල් හා ගිණුම් කාර්යාංශය මඟින් ලිපි යොමුකර ඇත. | අයවිය යුතු නිවාස කුලී මුදල මන්ත්‍රී දීමනාවෙන් අය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යැවීමට කටයුතු කළ යුතු වේ. |

**3.3.2. සේවක ණය ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.398,701 ක ණය ශේෂය වර්ෂ 06 ක් ඉක්මවා තිබුණි. | සේවා කාලය අවුරුදු 10ට වැඩි බැවින් ඇපකරුවෙකු නොමැතිව ගෙවීම් කර ඇති අතර පාර්ලිමේන්තුවේ සමිතියක සිදුවූ මුදල් වංචාවන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බැවින් ඔවුන්ගෙන් මෙම මුදල් අයකර ගැනීම සඳහා පියවර ගැනීමට නොහැකි වී ඇත. | අයවිය යුතු ණය ශේෂයන් අප්‍රමාදව පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තු පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.43,051 ක වෙනසක් වූ අතර 2020 හා 2021 වර්ෂවල එම වෙනස පිළිවෙලින් රු. 125,845 හා රු.43,022 ක් වී තිබුණි. | මෙම වෙනස හඳුනා ගැනීමට උත්සහ කරමින් සිටිමි. | දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සමාන වී තිබිය යුතු වේ. |

## 3.4 නොවිසඳුණු විගණන ඡේද

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2020 සහ 2021 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල 3.4 සහ 3.5 ඡේදවල දැක්වෙන “ සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට පටහැනිව, "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම.” සම්බන්ධයෙන් වන විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසර මත පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හට සහනදායී මෝටර්වාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය දීර්ඝකාලයක සිට ක්‍රියාවට නංවන ලද අතර ඒ පිළිබඳව විගණන විමසුමකින් අපගේ අවධානයට ලක්කළ පසු නැවත ඒ පිළිබඳව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් සෘජු පැහැදිලි කර ගැනීමක් ගරු කථානායකවරයා හා මුදල් අමාත්‍යවරයාගේ මැදිහත්වීම මත ලබා ගන්නා ලදී. ඒ අනුව එම පදනම මත පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සහනදායී මෝටර් වාහන බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය වර්තමානයේදී අත්හිටුවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 995 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 861 ක් විය. ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීයික මට්ටමේ,ද්විතියික මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 03, 40,52 හා 41 ක් ලෙස මුළු පුරප්පාඩු සංඛ්‍යාව 136 ක් විය. | අංක 2022/03 සහ 2022/4/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව සේවක බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා තිබුණ නමුත් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පිළිබඳ උපදේශක කාරක සභාවේදී ගත් විශේෂ අනුමැතියක් මත අත්‍යාවශ්‍ය පදනම මත 2022 වසර තුළ සේවකයින් 48 ක් ද 2023 වසර තුළ සේවක බඳවා ගැනීම් 28 ක් ද සිදු කර ඇත. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ එසේ නොවේ නම් කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අනුමත අනියම්/තාවකාලික සේවක සංඛ්‍යාව 8 ක් වු නමුත් ආයතනයේ තත්‍ය සේවක සංඛ්‍යාව 10 ක් වීමෙන් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් දෙදෙනෙක් බඳවා ගෙන තිබුණි. | ආයතනයේ තත්‍ය අනියම් හා තාවකාලික සේවක සංඛ්‍යාව 10 ක් ලෙස වර්ගීකරණය වී ඇත්තේ අනියම් 5 ක් සහ වෙනත් 5 ක් ලෙසයි. | අනුමත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 4.2 සන්නිවේදන දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය, යෝජිත වැටුපට සමාන මාසික දීමනාවක් මත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු නමුත් තනතුරු වර්ග 4 ක් සඳහා නිලධාරීන් 14 දෙනෙක් ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණි. | දෙපාර්තමේන්තුවේ තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට පත්කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව බඳවා ගැනීම් සිදු කළ යුතු වේ. |

## 4.3 සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තුවේ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් 2021 අප්‍රේල් 30 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු බව 2021 අප්‍රේල් 09 වෙනි දින ගැසට් පත්‍රයෙහි දක්වා තිබියදී ඊට පටහැනිව, 2021 මැයි 03 දින සිට 17 දින දක්වා ලැබී තිබුණු අයදුම් පත් 06 ක අයදුම්කරුවන්ට ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීම් කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ.<br><br>රටතුල පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සේවාවන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් අප්‍රේල් 30 දිනට පෙර ලියාපදිංචි තැපෑලට යොමු කරන ලද අයදුම්පත්‍ර 02 ක් සලකා බලා ඇත. අනෙකුත් අයදුම් පත්‍ර 04 රජයේ ආයතන ප්‍රධානීන් 30 වැනි දිනට පෙර අත්සන තබා ඇති බැවින් සලකා බැලීමට ලක් කොට ඇත. | ගැසට් නිවේදනයට අනුකූලව බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පළපුරුද්ද සඳහා ලකුණු 25 ක් වෙන් කර තිබුණද, නිලධාරීන් 07 දෙනෙකු සඳහා දී තිබූ ලකුණු ප්‍රමාණයන් සමාලෝචනය කිරීමේදී නිශ්චිත පදනමක් මත විධිමත්ව ලකුණු ලබා දී නොතිබුණි. | සේවා පළපුරුද්ද පිළිබඳ ඇගයීමේදී ලිඛිත සහතික මෙන්ම වාචිකව අයදුම්කරුවන් සමඟ විෂය පිළිබඳව කරන ලද ප්‍රශ්න කිරීම් තුළින් ඔවුනගේ විෂය පිළිබඳ පරිචයද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සැලකීමට භාජනය කොට තිබුණි. එම පදනම මත විගණනයේදි නිරීක්ෂණය කොට ඇති පරිදි විවිධ ලකුණු පරාසයන් හිමිව ඇත. | බඳවා ගැනීමේ පරිපාටියෙහි පළපුරුද්ද සඳහා නිශ්චිත හා විධිමත් ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අතිරේක සුදුසුකම් සඳහා මුළු ලකුණු 25 ක් වෙන් කර තිබුණු නමුත් එම ලකුණු බෙදා තිබූ ආකාරය නිවැරදි නොවිණි. | විගණනය විසින් හඳුනාගෙන ඇති ලකුණු ලබාදීමේ ක්‍රමවේදය නිවැරදි බව පෙනී යන අතරම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රමවේදය ලිපිගොනුව තුළ තවදුරටත් විග්‍රහකොට තිබුනේ නම් එය තවදුරටත් විනිවිදභාවය වැඩිකිරීමට හේතුවනු ඇත. | සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම විධිමත් ක්‍රමවේදයකට අනුව කළ යුතු වේ. |
| (ඈ) | තනතුර සඳහා තෝරා ගන්නා ලද එක් අයදුම්කාරිනියකගේ මූලික අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකම් ලෙස සලකා ලකුණු ලබාදී තිබුණු අතර එම සුදුසුකම් තහවුරු කරන සහතික පත්වල නිරවද්‍යතාවය සනාථ කර ගෙන නොතිබුණි. | සහතික පත්‍රවල නිරවද්‍යතාවය සනාථකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | මූලික සුදුසුකම් හා අතිරේක සුදුසුකම් නිවැරදිව හඳුනා ගතයුතු අතර සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා සහතික පත්වල නිරවද්‍යතාවය සනාථ කරගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | තෝරා ගෙන තිබූ නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරිනියකට මාස 02 දින 23 ක කාල ප්‍රමාදයකින් පසුව එනම්, 2022 ජුනි 27 දින වැඩ භාර ගැනීමට අවස්ථාව ලබා දී තිබුණි. | විගණනය විසින් සිදු කොට ඇති නිරීක්ෂණය නිවැරදි වේ. | බඳවා ගැනීමේ අවශ්‍යතාවය අනුව අප්‍රමාදව සේවයට වාර්තා කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (vii) ඡේදයට පටහැනිව එක් සහකාර පුස්තකාලයාධිපති පත්වීමක් සිදු කර තිබුණි. | පාර්ලිමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කාර්යය මණ්ඩල උපදේශක කාරක සභාවේ අනුමැතිය හා උපදෙස් ලැබී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |